විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකාව ෂැංහයි සහයෝගිතා සංවිධානය (SCO) සමඟ ඇති සම්බන්ධතාව ඉහළ නංවයි.

ෂැංහයි සහයෝගිතා සංවිධානයේ මහලේකම් නුර්ලන් යෙර්මෙක්බායෙව් මහතා 2026 මැයි 19 සිට 21 වැනි දින දක්වා ශ්‍රී ලංකාව තුළ නිල සංචාරයක නිරත වූ අතර එම නිල සංචාරය අතරතුරදී ඒ මහතා විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මහතා සමඟ අද (20/05) විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේදී ඵලදායී සාකච්ඡා පැවැත්වීය. ෂැංහයි සහයෝගිතා සංවිධානයේ මහලේකම්වරයෙකු ශ්‍රී ලංකාවට කළ පළමු සංචාරය වන මෙම සංචාරය, එම සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ සම්බන්ධතාව ඉහළ නැංවීමට දායක වනු ඇත.

සංචාරක, ප්‍රවාහන සහ සැපයුම් සහ කෘෂිකර්මාන්තය යන අංශ ගණනාවක් ඔස්සේ ෂැංහයි සහයෝගිතා සංවිධානයේ සහ එහි හවුල්කාර රටවල් අතර සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සහ වර්ධනය කිරීම කෙරෙහි මෙම සාකච්ඡාවලදී අවධානය යොමු විය. ෂැංහයි සහයෝගිතා සංවිධානයේ මූලපිරීම්වලට සම්බන්ධ වීමට ශ්‍රී ලංකාව දක්වන දැඩි උනන්දුව අමාත්‍ය හේරත් මහතා අවධාරණය කළ අතර, ශ්‍රී ලංකාව ආයෝජන සහ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා මහලේකම්වරයාගේ සහය ඉල්ලා සිටියේය.

මෙම සංචාරයේදී මහලේකම්වරයා වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය අනුර කරුණාතිලක, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කේ.ඩී. ලාල් කාන්ත සහ සංචාරක නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය රුවන් රණසිංහ යන මහත්වරුන් සමඟ ඵලදායී සාකච්ඡා පැවැත්වීය.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ 01

2026 මැයි 21 වැනි දින

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk